ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date. 2025.06.11 |

ඩී.එම්.ජේ.බී.දිසානායක
අංක 89, බොරවැව,
සෙවනපිටිය.

පැමිණිලිකාර පාර්ශවය

01. විදුහල්පති
පො/තෝපාවැව ජාතික පාසල
පොළොන්නරුව

02. ඩී.එම්.යූ.දිසානායක
විදුහල්පති (හිටපු)
පො/තෝපාවැව ජාතික පාසල
පොළොන්නරුව
( විශ්‍රාම )
(සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සභාපති)

03. සී.ඩී.කේ.මාගම්මන
නියෝජ්‍ය විදුහල්පති
පො/තෝපාවැව ජාතික පාසල
පොළොන්නරුව
(සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ලේකම්)

04. එම්.ජී.ඩී. අරුණකාන්ති
පො/තෝපාවැව ජාතික පාසල
පොළොන්නරුව
(සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජික)

05. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල

වගඋත්තරකාර පාර්ශවය

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිලි අංකය : **HRC/ANU/344/2024(T)**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකරු විසින් 2024.07.24 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, පැමිණිලිකරුගේ දරුවා වන ඩී.එම්.දිදුල සස්මිත බණ්ඩාර යන අයව 2024 වසරේදී 07 වසර සඳහා පො/තෝපාවැව ජාතික පාසලට ඇතුලත් කිරීම සඳහා අයදුම්පතක් යොමු කළ බවත්, මෙම අයදුම්පත අනුව 2024 මැයි මස 20 දින එම පාසලේ පැවති සම්මුඛ පරික්ෂණයක් සඳහා දරුවා සමඟ ඉදිරිපත් වූ බවත්, එකී සම්මුඛ පරික්ෂණයේදී තම දරුවාට ලකුණු 34ක් ලැබුණු බවත් ය.

එසේම, එම සම්මුඛ පරික්ෂණය අනුව පො/තෝපාවැව ජාතික පාසලේ 7 වසර සඳහා දරුවන් ඇතුලත් කර ගැනිම සිදුවූ බවත්, තම දරුවා මෙම පාසල වෙත ඇතුලත් කර ගැනීමට නොහැකි වූ නමුත්, මෙම සම්මුඛ පරික්ෂණයේදී තම දරුවාට වඩා අඩු ලකුණු ලැබූ දරුවන් දෙදෙනෙකු පො/තෝපාවැව ජාතික පාසලට ඇතුලත් කරගෙන ඇති බවත්, එමගින් තම දරුවාගේ අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.08.06 දිනැති වාර්තාව මගින් කරුණු දක්වමින් 2 වන වගඋත්තරකරු වන පො/තෝපාවැව ජාතික පාසලේ හිටපු විදුහල්පතිවරයා මෙන්ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළ ඩී.එම්.යූ.දිසානායක යන අය ප්‍රකාශ කර සිටින්නේ, පොළොන්නරුව තෝපාවැව ජාතික පාසලේ (මෛත්‍රීපාල සිරිසේන ජාතික පාසල) අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුලත් කිරීමේදී විද්‍යාලයේ ප්‍රතිපත්තියක් ලෙස හා විද්‍යාලයේ උන්නතිය වෙනුවෙන් ක්‍රීඩා, සෞන්දර්ය, භාෂා කුසලතා වැනි දේවලින් දක්ෂ සිසුන් බඳවා ගැනීමට අරමුණු කරනු ලබන බවත්, එම නිසා ශිෂ්‍යත්වය අසමත් වුවද දක්ෂතා තිබෙන දරුවන්ට අවස්ථාව සලස්වනු ලබන බවත්, ඒ බව චක්‍රලේඛනය තුළින් ද පැහැදිලි වන බවත් ය.

එසේම, සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරුගේ දරුවාට කිසිසේත්ම අඩු ලකුණු ලබා දී නොමැති බවත්, පැමිණිලිකරු විසින් පැමිණිල්ලේ සඳහන් කරන ලද දරුවන් ශිෂ්‍යත්ව විභාගයේදී ලකුණු 120ක ප්‍රමාණය ඉක්මවා ලකුණු ලබාගෙන ඇති බවත්, එක් දරුවෙකු වයස අවුරුදු 15න් පහළ ක්‍රිකට් ක්‍රීඩාවට දක්ෂ දරුවෙකු වන බවත්, අනෙක් දරුවා දක්ෂ කරාටේ ක්‍රීඩකයෙකු වන බවත්, පැමිණිලිකරුගේ දරුවා පොරොත්තු ලේඛණයේ තුන්වන ස්ථානයේ සිටින බවත්, මෙම දරුවා දැනටමත් පාසලට බඳවා ගැනීමට 2024.07.27 දිනැති ඇතුලත් කිරීමට නොපැමිණි දරුවන් සලකා බලා පැමිණිලිකරුගේ දරුවා බඳවා ගැනිමට හැකි බවත් 2 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

තවද, පැමිණිලිකරු අදාළ චක්‍රලේඛනය වරදවා තේරුම් ගෙන ඇති බවත්, ඔහු විසින් ශිෂ්‍යත්ව ලකුණු වලින් පමණක් අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුලත් කරගෙන ඇති බවට සිතා කටයුතු කරනු ලබන බවත්, තෝරාගත් සිසුන්ගේ නාම ලේඛනය අනුමත වීමෙන් පසු පැමිණිලිකරුගේ දරුවා ඇතුලු අනෙක් දරුවන් ඇතුලත් කිරීම සඳහා පුරප්පාඩු පවතින බවත් 2 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ලට අදාළව සිදු කළ විමසීමේ දී 3 වන වගඋත්තරකරු වන පො/තෝපාවැව ජාතික පාසලේ නියෝජ්‍ය විදුහල්පති මෙන්ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ සී.ඩී.කේ.මාගම්මන යන අය විසින් ප්‍රකාශ කර ඇත්තේ ඔහු අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද සහතිකපත්‍ර පරීක්ෂා කිරීම සිදු කරන ලද බවත්, ලකුණු ලබාදීම 2 වන වගඋත්තරකරු වන හිටපු විදුහල්පතිවරයා විසින් සිදු කරන ලද බවත් ය.

එසේම, මෙම පැමිණිල්ලට අදාළව සිදු කළ විමසීමේ දී 4 වන වගඋත්තරකරු වන පො/තෝපාවැව ජාතික පාසලේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකාවක වශයෙන් කටයුතු කළ එම්.ජී.ඩී. අරුණකාන්ති යන අය විසින් ප්‍රකාශ කර ඇත්තේ ඇය විසින් 2 වන වගඋත්තරකරු වන හිටපු විදුහල්පතිවරයා විසින් ලබාදුන් ලකුණු සටහන් කිරීම පමණක් සිදු කළ බවත්, අදාළ ලකුණු ලබාදීම සිදු කරන ලද්දේ 2 වන වගඋත්තරකරු වන හිටපු විදුහල්පතිවරයා විසින් පමණක් වන බවත් ය.

5 වන වගඋත්තරකරු වන අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) විසින්අංක ED/1/6/12/HRC/2024/30 සහ 2024.10.10 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් 2024 වර්ෂයේ අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමට 17/2023 චක්‍රලේඛය ප්‍රකාරව පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව, පො/ තෝපාවැව මහා විද්‍යාලයේ විදුහල්පති විසින් සම්මුඛ පරීක්ෂණ පවත්වාගන්න තෝරා ගන්නා ලද සිසුන්ගේ නම් ලැයිස්තුව නිර්දේශ කර 2024.05.31 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත්, එම ලේඛනය අනුව 2 වන ශ්‍රේණිය සඳහා සිසුන් 4ක්, 3 වන ශ්‍රේණිය සඳහා සිසුන් 2ක්, 7 වන ශ්‍රේණිය සඳහා සිසුන් 21ක්, 8 වන ශ්‍රේණිය සඳහා සිසුන් 6ක් සහ 9 වන ශ්‍රේණිය සඳහා සිසුන් 2ක් වශයෙන් සිසුන් තිස්පස් දෙනෙකු පාසලට ඇතුළත් කිරීමට අනුමත කර යවා ඇති බවත් සඳහන් කර ඇත.

එසේම, එම සිසුන් ඇතුළත් කිරීමෙන් අනතුරුව තවදුරටත් ඇතිවූ පුරප්පාඩු ලෙස 9,7 සහ 2 ශ්‍රේණි සඳහා සිසුන් 5 දෙනෙකුගේ නම් නිර්දේශ කර පො/ තෝපාවැව මහා විද්‍යාලයේ විදුහල්පති විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවා තිබූ නමුත්, එම සිසුන් තෝරා තිබූ ක්‍රමවේදය ගැටලු සහගත වූ බැවින් එම ලේඛනය සඳහා අනුමැතිය ලබාදී නොමැති බව නිරීක්ෂණය වන බව ද අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) විසින් ඉහත කී වාර්තාව තුළින් දක්වා ඇත. සම්මුඛ පරීක්ෂණ ලකුණු ලේඛනයේ එම සිසුන්ට වඩා ලකුණු ලබාගත් සිසුන් සිටින බවද නිරීක්ෂණ වූ බවත්, දෙවනවර පුරප්පාඩු කැඳවීමේදී

එම සිසුන් ද සම්මුඛ පරීක්ෂණයට නැවත ලක් කර ලැයිස්තු යොමු කරන ලෙස විදුහල්පති දැනුම්වත් කර ඇති බවත් එකී වාර්තාව තුළින් දක්වා ඇත.

තවද, මේ වන විට 17/2023 චක්‍රලේඛය ප්‍රකාරව 2024 වර්ෂයේ අතරමැදි ශ්‍රේණි වලට සිසුන් ඇතුළත් කිරීම සඳහා දෙවනවරට ද පුරප්පාඩු කැඳවා ඇති අතර, කඩිනමින් එම පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරනු ලැබෙන බවත්, 2024.08.15 දිනට කැඳවන ලද පුරප්පාඩු ලේඛන අනුව පො/ තෝපාවැව මහා විද්‍යාලයේ 7 ශ්‍රේණියේ පුරප්පාඩු තුනක් පවතින බවත්, ඒ අනුව පාසලට අයදුම්පතක් යොමු කිරීමෙන් මෙම පැමිණිලිකරුගේ දරුවාට දුන් පාසලට ඇතුළත් වීම සඳහා අවස්ථාව පවතින බවත් අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) විසින් ඉහත කී වාර්තාව තුළින් වැඩිදුරටත් දක්වා ඇත.

<u>නිරීක්ෂණ</u>

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 17/2023 සහ 2023.04.25 දිනැති චක්‍රලේඛය මගින් පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුලත් කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන හඳුන්වා දී ඇති අතර, එකී චක්‍රලේඛය අනුව 7 ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමට 2 වන වගඋත්තරකරු වන පො/ තෝපාවැව ජාතික පාසලේ හිටපු විදුහල්පතිවරයා විසින් කටයුතු කර ඇති බවත්, පැමිණිලිකරු විසින් ද එකී චක්‍රලේඛයේ 3.1(ඊ) යටතේ දක්වා ඇති පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණයේ එක් එක් වර්ෂයේ දිස්ත්‍රික් කඩඉම් ලකුණු සීමාව ඉක්මවූ 7 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා සිසුන් යන කාණ්ඩය යටතේ ඒ සඳහා අයදුම් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛණ අනුව ඔහුගේ දරුවා වන ඩී. එම්.ඩී.එස්. බණ්ඩාර යන අය 2022 වර්ෂයේදී වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොළොන්නරුව දිඹුලාගල කලාපයේ පො/දිඹු/සෙවනපිටිය ප්‍රාථමික විද්‍යාලයේදී පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 152ක් ලබාගෙන සමත්ව ඇති ඇති බවත්, මේ වන විට පො/දිඹු/ සෙවනපිටිය මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන බවත් අනාවරණය වී ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්ව ඇති බැවින් ඉහත කී අංක 17/2023 දරණ චක්‍රලේඛයේ 3.1(ඊ) ප්‍රකාරව අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පැමිණිලිකාර පාර්ශවය සහ වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට ඇති සියළුම ලේඛන සලකා බැලීමේදී පාසල්වලට 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුලත් කිරීම සඳහා වන 17/2023 චක්‍රලේඛය අනුව පො/ තෝපාවැව ජාතික පාසලේ 7 ශ්‍රේණියේ පවතින සිසුන් 21 දෙනාගේ පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා 2024.05.20 වන දින සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති බවටත්, එම සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් 70 දෙනෙකු අයදුම්පත් ඉදිරිපත් කොට ඇති බවටත්, ඉන් 53 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත්ව ඇති බවටත්, පැවති පුරප්පාඩු 21 පිරවීම සඳහා අවම ලකුණු සීමාව 36

සිට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් තෝරාගෙන ඇති බවටත්, තෝරා ගත් 21 දෙනෙකුගේ නම් ලයිස්තුවක් සකස්ව ඇති බවටත්, එම 21 දෙනාගේ නාම ලේඛණය අනුමැතිය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා ඇති බවත් නිරීක්ෂණය වේ.

ඉහත කී 2024.05.20 වන දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලේඛණය අනුව අංක 44 යටතේ පැමිණිලිකරුගේ දරුවා වන ඩී.එම්.ඩී.එස්.බණ්ඩාර යන අයගේ ලකුණු පෙළ ගස්සවා ඇති අතර, ඔහු ලකුණු 34ක් ලබාගෙන ඇති බව පෙනී යයි. ඒ අනුව කඩඉම් ලකුණු සීමාව වන ලකුණු 36 ක ප්‍රමාණය ලබානොගැනීම හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවා පො/ තෝපාවැව ජාතික පාසලේ 7 වන ශ්‍රේණිය සඳහා ඇතුළත් කරගෙන නොමැති බව පැහැදිලි වේ.

තවද, මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා 2 වන වගඋත්තරකරු වන පො/ තෝපාවැව ජාතික පාසලේ හිටපු විදුහල්පති ඩී.එම්.යූ.දිසානායක, 3 වන වගඋත්තරකරු වන නියෝජ්‍ය විදුහල්පති සී.ඩී.කේ. මාගම්මන සහ 4 වන වගඋත්තරකාරිය වන එම්.ජී.ඩී. අරුණකාන්ති යන අයලුවන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් ලෙස සහභාගී වී ඇති බව පෙනී යයි.

තවද, 2024.05.20 වන දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලේඛනය සලකා බැලීමේදී 17/2023 චක්‍ර ලේඛණය අනුව අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා නිර්ණායකයන් 04ක් යටතේ ලකුණු ලබාදී ඇති බව නිරීක්ෂණය වන අතර, එම නිර්ණායකයන් පිළිවෙලින් පදිංචිය, ස්ථාන මාරු, විදේශ සහ සිසුන්ගේ අධ්‍යාපන ප්‍රගතිය වේ.

මෙම පැමිණිලිකරුගේ දරුවා වන ඩී.එම්.දිදුල සස්මිත බණ්ඩාර යන අය වෙත ලකුණු ලබාදී ඇති ආකාරය නිරීක්ෂණය කිරීමේදී ඔහු හට ඉහත කී නිර්ණායකයන් අතරින් ‘අධ්‍යාපන ප්‍රගතිය’ යන නිර්ණායකය යටතේ ලකුණු 34ක් ලැබී ඇති බවත්, වෙනත් කිසිදු නිර්ණායකයක් සඳහා ලකුණු ලැබී නොමැති බවත් නිරීක්ෂණය වේ.

එසේවුවද, අංක 17/2023 දරණ චක්‍රලේඛයේ 3.4.5.1 යටතේ පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව සඳහා ලකුණු ලබා දීමේ දී පදිංචි ස්ථානයේ සිට පාසල දක්වා ඇති කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කරගත යුතු බවත්, අදාළ දුර ප්‍රමාණය කි.මී. 10ක් ඇතුළත නම් ලකුණු 25ක් ද, කි.මී. 10 ට වැඩි කි.මී. 15 දක්වා නම් ලකුණු 20ක් ද, කි.මී. 15ට වැඩි කි.මී. 20 දක්වා නම් ලකුණු 15ක් ද, කි.මී. 20ට වැඩි නම් ලකුණු 05ක් ද ලබා දිය යුතු බවත් දක්වා ඇත. එසේම, 3.4.5.2 යටතේ එකී ලකුණු මෙම චක්‍රලේඛයේ 3.1 හි (අ) කාණ්ඩය හැර සෙසු සියලුම කාණ්ඩවලට පොදු වන බව ද දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරු සිය දරුවා 7 ශ්‍රේණිය සඳහා ඇතුළත් කරගැනීමට අයදුම් කර ඇත්තේ එකී චක්‍රලේඛයේ 3.1 (ඊ) යටතේ වන බැවින් 3.4.5.1 යටතේ පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව සඳහා පැමිණිලිකරු හට ලකුණු හිමි විය යුතු බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - පොළොන්නරුව ඩිපෝව මගින් ලබාගෙන ඇති දුර ප්‍රමාණය සනාථ කිරීමේ ලේඛනයට අනුව පැමිණිලිකරු පදිංචිව සිටින බොරවැව ප්‍රදේශයේ සිට පො/ තෝපාවැව

ජාතික පාසල දක්වා ඇති දුර ප්‍රමාණය කි.මී. 24ක් බව දක්වා ඇත. මේ අනුව ඉහත කී චක්‍රලේඛයේ 3.4.5.1 යටතේ පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව සඳහා ලකුණු ලබා දීමේ දී පදිංචි ස්ථානයේ සිට පාසල දක්වා ඇති කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කරගැනීමේ දී අදාළ දුර ප්‍රමාණය කි.මී. 20ට වැඩි නම් ලකුණු 05ක් හිමි වන අතර, පැමිණිලිකරුට ඇති දුර ප්‍රමාණය, කි.මී. 20 ට වැඩි කි.මී. 24ක දුර ප්‍රමාණයක් වන බැවින් ඔහු හට ලකුණු 05ක ප්‍රමාණයක් හිමි විය යුතු බව තහවුරු වේ. එකී ලකුණු 05ක ප්‍රමාණය ලබාදුන් විට පැමිණිලිකරුගේ දරුවාගේ මුළු ලකුණු සංඛ්‍යාව ලකුණු 34 නොව 39ක් ලෙස සංශෝධනය විය යුතු බව ද නිරීක්ෂණය වේ.

කෙසේවුවද, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉහත කී දුර ප්‍රමාණයන් සඳහා අනෙකුත් අයදුම්කරුවන් වෙත ලකුණු ලබාදීමේදී එය 'පදිංචිය' යන නිර්ණායකය යටතේ සලකා බලා ඇති බවත්, දුර ප්‍රමාණයට අමතරව 'පදිංචිය' යන නිර්ණායකය යටතේ 'ඔප්පු බලපත්‍ර' ලෙස තවත් අනු නිර්ණායකයක් සඳහා ලකුණු ලබා දී ඇති බවත් පෙනී යන නමුත්, එවැනි අනු නිර්ණායකයක් සඳහා ලකුණු ලබාදීමේ දී අදාළ කරගත යුතු පටිපාටියක් පිළිබඳව චක්‍රලේඛයේ සඳහන් නොවන බව ද පෙනී යයි.

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් කියා සිටින්නේ, පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුලත් කිරීම සඳහා වන අංක 17/2023 දරණ චක්‍රලේඛය අනුව අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණය සිදුකිරීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන්හට ලකුණු ලබාදීමේදී චක්‍රලේඛයේ සඳහන් නියමයන්ට පටහැනිව ලකුණු ලබාදීම් සිදුකර ඇති බවයි. එසේම, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේදී 17/2023 චක්‍රලේඛය ප්‍රකාරව නිවැරදිව සිසුන් ඇතුලත් කිරීමට සලකා බලනු ලබන කාණ්ඩ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී භාවිතයට ගෙන නොමැති බවත්, තම ප්‍රදේශයේ තම නිවසට වඩා වැඩි දුරකින් සුසිරිගම හා මලින්ද යන ප්‍රදේශවල පදිංචිය දරණ අංක 46 සහ 51හි සඳහන් දරුවන් දෙදෙනෙකුට 3.4.5.1 යටතේ දුර සඳහා ලකුණු 15 බැගින් ලබා දී ඇති බවත්, මෙලෙස ලකුණු ලබාදීමෙන් චක්‍රලේඛයේ සඳහන් ප්‍රතිපාදන උල්ලංඝණය කර ඇති බවත් ය.

2024.05.20 වන දින පැවති සම්මුඛ පරීක්ෂණයේ අංක 46 දරණ අයදුම්කරුගේ ලිපිනය, 230, මලින්ද, සෙවනපිටිය යනුවෙන් සඳහන් කර ඇති අතර, අංක 51 දරණ අයදුම්කරුගේ ලිපිනය, 277, සුසිරිගම, සෙවනපිටිය යනුවෙන් සඳහන් කර ඇත. මෙම අයදුම්කරුවන් දෙදෙනා හට 'දුර' සඳහා ලකුණු 15 බැගින් ලබාදී ඇති බව ලකුණු ලේඛනය අනුව නිරීක්ෂණය වේ. පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - පොළොන්නරුව ඩිපෝව මගින් ලබාගෙන ඇති දුර ප්‍රමාණය සනාථ කිරීමේ ලේඛනයන්ට අනුව මලින්ද සිට පො/ තෝපාවැව ජාතික පාසල දක්වා ඇති දුර ප්‍රමාණය කි.මී. 24.5ක් බවත්, සුසිරිගම සිට පො/ තෝපාවැව ජාතික පාසල දක්වා ඇති දුර ප්‍රමාණය කි.මී. 21ක් බවත් දක්වා ඇත.

ඒ අනුව එම අයදුම්කරුවන් දෙදෙනාගේ දුර ප්‍රමාණයන් කි.මී. 20ට වඩා වැඩි වන බැවින් 17/2023 චක්‍රලේඛය ප්‍රකාරව හිමි විය යුත්තේ ලකුණු 05ක් පමණි. එම නිසා ලකුණු 15 බැගින් ලබාදීම තුළින්

වැඩි ලකුණු 10 බැගින් ඔවුන් හට හිමි වී ඇති බව පෙනී යයි. එසේහෙයින් එලෙස නිවරදි නොවන අයුරින් ලබා දී ඇති වැඩි ලකුණු ප්‍රමාණයන් ඔවුන්හට ලබා දී ඇති මුළු ලකුණු සංඛ්‍යාවෙන් අඩු කළ පසු අංක 46 දරණ අයදුම්කරුගේ මුළු ලකුණු සංඛ්‍යාව ලකුණු 44 නොව 34 ලෙස සංශෝධනය විය යුතු බවත්, අංක 51 දරණ යදුම්කරුගේ මුළු ලකුණු සංඛ්‍යාව ලකුණු 38 නොව 28 ලෙස සංශෝධනය විය යුතු බවත් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. ඒ අනුව ඉහත කී අංක 46 සහ 51 යටතේ අයදුම් කළ දරුවන් දෙදෙනාගේ මුළු සංඛ්‍යාවන්, කඩඉම් ලකුණු සීමාව වන ලකුණු 36ක ප්‍රමාණය ඉක්මවා යන බවට දක්වමින් පො/ තෝපාවැව ජාතික පාසලෙහි 7 ශ්‍රේණියට ඇතුළත් කරගෙන තිබුණ ද, ඉහත සඳහන් කළ පරිදි නිවැරදි නොවන අයුරින් ඔවුන්හට ලබා දී ඇති ලකුණු ප්‍රමාණයන් මුළු ලකුණු සංඛ්‍යාවෙන් අඩු කළ පසු කඩඉම් ලකුණු සීමාව වන ලකුණු 36ක ප්‍රමාණය ඉක්මවා නොයන බව පැහැදිලි වේ.

කෙසේවෙතත් 2 වන වගඋත්තරකරු වන හිටපු විදුහල්පතිවරයා විසින් 7 ශ්‍රෙණිය සඳහා තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳව තොරතුරු ඇතුලත් වාර්තාවක් අධ්‍යාපන අමත්‍යාංශයේ ලේකම් වෙත යොමුකර ඇති අතර, ඒ අනුව අදාල සිසුන් පාසල වෙත ඇතුලත් කිරීම සඳහා අනුමැතියද ලැබී ඇති අතර, එම අනුමැතිය අනුව ඉදිරිපත් වූ අයදුම්කරුවන් 21 දෙනෙකු අතරින් 19 දෙනෙකු පාසලට ඇතුලත් කර ගෙන ඇති බව නිරීක්ෂණය වේ. එලෙස අයදුම්කරුවන් 19 දෙනෙකු ඇතුළත් කර ගැනීමෙන් අනතුරුව ඉතිරි වූ පුරප්පාඩු 02 පිරවීම සඳහා නැවත සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇති බවත්, එම පුරප්පාඩු 02 සඳහා සිසුන් දෙදෙනෙකු ඇතුළත් කරගැනීමට 1 වන වගඋත්තරකරු වන පො/ තෝපාවැව ජාතික පාසලෙහි වර්තමාන විදුහල්පතිවරයා විසින් කටයුතු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේ දී පැමිණිලිකරුගේ දරුවා හට 2024.05.20 වන දින පැවති සම්මුඛ පරීක්ෂණයේ දී නිසි පරිදි ලකුණු ලබා දීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු නොකිරීම හේතුවෙන් එම දරුවා හට පො/ තෝපාවැව ජාතික පාසලෙහි 7 ශ්‍රේණියට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බවත්, 17/2023 චක්‍රලේඛය ප්‍රකාරව නිවැරදි ලෙස ලකුණු ලබා නොදීම හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවාවට වඩා අඩු ලකුණු ලැබූ සහ කඩයිම් ලකුණු සීමාව ඉක්මවා යාමට අපොහොසත් වූ දරුවන් දෙදෙනෙකු ඇතුළත් කරගෙන ඇති බවත් තහවුරු වේ.

එසේහෙයින් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමට අදාළව වගකිව යුතු නිලධාරියා වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළ 2 වන වගඋත්තරකරු වන පො/ තෝපාවැව ජාතික පාසලෙහි හිටපු විදුහල්පතිවරයා විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නීතිය පසිඳලීම ද නීතිය ක්‍රියාත්මක කිරීම

ද සැම දෙනාටම එක හා සමාන විය යුතු බවට වන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

1. පැමිණිලිකරුගේ දරුවා පො/ තෝපාවැව ජාතික පාසලෙහි 8 වන ශ්‍රේණියට ඇතුළත් කරගැනීමට 1 වන වගඋත්තරකරු විසින් කටයුතු කළ යුතු ය.

2. මෙම පැමිණිල්ලට අනුව සලකා බැලීමේ දී අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කරගැනීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 17/2023 දරණ චක්‍රලේඛයෙන් පරිබාහිරව කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන බැවින් ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති වීම වැළැක්වීම සඳහා විදුහල්පතිවරුන් හට උපදේශන මාලාවක් සම්පාදනය කොට ඒ පිළිබඳව දැනුම්වත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු ය.

2025. 07. 22 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හි... ...න් සභාව

නිමල් ජී .පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් අනෙක් පිටුවෙහි ඇත.

පිටපත් :- 01. අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා

03. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - අවශ්‍ය පියවර ගැනීම සඳහා